# මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී භාවිතා කරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වල නෛතික පසුබිම
- මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව
- ගිණුම්කරණ ප්‍රතිපත්ති ,ගිණුම්කරණ ඇස්තමේන්තු වෙන්ස්වීම්, වැරදි, සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම්
- තොග සම්බන්ධ ගිණුම් ගත කිරීම්
- දේපල පිරියත හා උපකරණ වලට අදාළ මූලික සංකල්ප විග්‍රහ කිරීම හා ගිණුම්ගත කිරීම
- ප්‍රතිපාදනයන් අසම්භාව්‍ය වගකීම් අසම්භාව්‍ය වත්කම් සම්බන්ධයෙන් ගිණුම් තැබීම හා හෙළිදරව් කිරීම්
- කල්බදු සඳහා ගිණුම්කරණය
- වාර්තා කරන කාලච්ඡේදය පසු සිදුවීම් සම්බන්ධයෙන් ගිණුම් තැබීම හා හෙළිදරව් කිරීම්
- අයභාර හඳුනාගැනීම සඳහා ගිණුම් තැබීම

## අ පො ස උසස් පෙළ සඳහා අදාල වෙන ප්‍රමිත (9)

| | | |
|---|---|---|
| ➢ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම් | LKAS | 1 |
| ➢ තොග | LKAS | 2 |
| ➢ මුදල් ප්‍රවාහ ප්‍රකාශන | LKAS | 7 |
| ➢ ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි | LKAS | 8 |
| ➢ වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම් | LKAS | 10 |
| ➢ දේපල පිරියත හා උපකරණ | LKAS | 16 |
| ➢ ප්‍රතිපාදන අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් | LKAS | 37 |
| ➢ කල්බදු | SLFRS | 16 |
| ➢ ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් වලින් ඇතිවන අයභාරය | SLFRS | 15 |

## ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වල නෛතික පසුබිම

### ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හැඳින්වීම

මූල්‍ය ප්‍රකාශන වල **විශ්වසනීයත්වය හා ගුණත්වය** උසස් කරලීමට ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ·

මූල්‍ය ප්‍රකාශන වල කාර්යභාරය වන්නේ ව්‍යාපාරය පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන්ට අවශ්‍ය ආර්ථික තොරතුරු ඉදිරිපත් කිරීමයි· එම තොරතුරු පදනම් කරගෙන ඔවුන් නොයෙකුත් ආර්ථික තීරණ ගනු ලැබේ· මූල්‍ය ප්‍රකාශන වල ගුණාත්මක බව හා ඒකාකාරී බව රැක ගැනීමට ගිණුම්කරණ ප්‍රමිත විශාල කාර්ය භාරයක් ඉටු කරයි·

## ගිණුම්කරණ ප්‍රමිති යනු

ව්‍යාපාර ගනුදෙනු හඳුනාගැනීමේදී මිනුම්කරණයේ දී ගිණුම්කරණයේ දී ඉදිරිපත් කිරීමේදී හා අනාවරණය කිරීමේ දී අනුගමනය කළ යුතු යැයි වෘත්තීය ගිනුම්කරන ආයතනයේ නිර්දේශිත මග පෙන්වීම් සමුදායකි·

### ගිණුම්කරණ ප්‍රමිති සකස් කරන්නේ කවුද

ගිණුම්කරණ ප්‍රමිත සකස් කිරීමේ අධිකාරී බලය ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ටයි· වරලත් ගණකාධිකාරී ආයතනය **1959 අංක 23** දරණ පනත මගින් සංස්ථා සංස්ථාපිත ආයතනයකි

### 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත

මේ පනතෙන් නිශ්චිතව හඳුනා ගන්නා ලද ව්‍යාපාර ආයතන තම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වල නිර්දේශයන් අනුගමනය කළ යුතු බව මෙම පනතෙන් අනාවරණය කර තිබේ·

එසේ නොකිරීම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් උල්ලංඝනය කිරීමක් නිසා එවැනි ව්‍යාපාරවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත හැක· මෙ පනතේ ස්ථාපිත මණ්ඩල දෙකකි·

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කමිටුව·
- ශ්‍රී ලංකා ගිණුම් ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය·

## ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කමිටුව

**1995 අංක 15** දරණ ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත මගින් ස්ථාපිත කර ඇත ·

### කාර්යභාරය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ගිණුම්කරණ ප්‍රමිති සකස් කිරීම්ට හා ඒවා

නිර්දේශ කිරීම් සඳහා සහාය වීම

**සාමාජිකයන්**

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක සභාව නම් කරන එම ආයතනයේ පස්දෙනෙක්
- සමාගම් රෙජිස්ටාර්
- සුරැකුම් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්
- මහ බැංකුවේ නියෝජිතයෙක්
- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ සාමාජිකයින්

## ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

**1995 අංක 15** දරණ ගිණුම්කරණකරණ හා විගණන ප්‍රමිත පනත මගින් ස්ථාපිත කර ඇත ·

**කාර්යභාරය**

- පනතේ සඳහන් විශේෂිත ව්‍යාපාර තම ගිණුම් ප්‍රකාශන සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේ දී ගිණුම් ප්‍රමිත වලට අනුව සකස් කර ඇත්දැයි විමර්ශනය කරනු ලැබේ·
- එලෙස සකස් කර නොමැති විට නීතිමය පියවර ගැනීම·

**සාමාජිකයින්**

- මහ බැංකුවේ නියෝජිතයෙක්
- සුරැකුම් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්
- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ සාමාජිකයෙක්
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස්


## ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ කාර්ය කාර්යභාරය

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රම හඳුන්වා දීම
- වරලත් ගණකාධිකාරීන් බිහිකිරීම සඳහා විභාග පැවැත්වීම හා ඊට අදාළ පාඨමාලා නියම කිරීම්
- ශිෂ්‍ය අධ්‍යාපනය හා පුහුණුව අධීක්ෂණය හා පාලනය
- වෘත්තීය යහපත හා අභිවෘද්ධිය සුරැකීම
- ගිණුම්කරණ හා ඊට අදාළ විෂයයන් පිළිබඳ පර්යේෂණ කිරීම හා දිරිගැන්වීම්

## <u>මූල්‍ය වාර්තාකරණයේ  සංකල්පනාත්මක රාමුව</u>

මූල්‍ය  ගිණුම්කරණයේ හා මූල්‍ය ප්‍රකාශන වල කාර්යභාරය හා සීමා නියම කරනු ලබන  මූලධර්ම පද්ධතියක් ලෙස මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව හැඳින්විය හැක·

### සංකල්පනාත්මක රාමුවේ අන්තර් අන්තර්ගතය




### මූල්‍ය ප්‍රකාශන වල අරමුණ

වාර්තා කරන ඒකකයේ දැනට  සිටින සහ අපේක්ෂිත ආයෝජකයන්ට ණය සපයන්නන්ට සහ අනෙකුත් ණය හිමියන්ට එම ඒකකයට අදාළ ව සම්පත් සැපයීම පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය වන මූල්‍ය තොරතුරු සැපයීමයි

### මූල්‍ය තොරතුරු වල ගුණාත්මක ගති ලක්ෂණ

මූල්‍ය තොරතුරු වල ගුණාත්මක ගති ලක්ෂණ

මූලික ගුණ ගුණාත්මක ගති ලක්ෂණ

- අදාළ බව
- විශ්වසනීය නියෝජනය

වැඩි දියුණු කිරීමේ ගුණ ගුණාත්මක ගති ලක්ෂණ

- සංසන්දනය
- සත්‍යාපනය කළ හැකි බව
- කාලීන බව
- තේරුම් ගත හැකි බව

## මූලික ගුණාත්මක ගති ලක්ෂණ

ගිණුම් කරණය තුලින් සපයන තොරතුරු වලට භාවිතා කරන පාර්ශවයන් ගේ තීරණ වෙනස් කිරීමට හැකියාවක් තිබේ නම් එම තොරතුරු මූලික ගුණාත්මක ගති ලක්ෂණ වලින් යුක්ත වේ ·එවැනි ලක්ෂණ දෙකකි·

- ✓ අදාළත්වය
- ✓ විශ්වසනීය නියෝජනය

- **අදාළත්වය**

තොරතුරු භාවිතා කරන පාර්ශනයන්ගේ තීරණ වෙනස් කිරීමට අදාල වන තොරතුරු සැපයිය යුතු බව මෙයින් අදහස් වේ· උදාහරණ ගණක යන්ත්‍රයක් රුපියල් 1000 වුණත් **වියදමක්** සේ සලකන්නේ තීරණ ගැනීම්ට අදාල නොවන වත්කමක් නිසා ය·

මෙයට අදාල අනුලක්ෂණ තුනකි·

- ▪ ප්‍රතිපෝෂණ හැකියාව
- ▪ පුරෝකතනය
- ▪ ප්‍රමාණාත්මක බව

✓ **ප්‍රතිපෝෂණ හැකියාව**

ගිණුම්කරන තොරතුරුවලින් ව්‍යාපාරය **අතීතය** ගැන තීරණය ගත හැකි නම් අදාල තොරතුරු ප්‍රතිපෝෂණ

හැකියාවෙන් යුක්ත වේ·

| වර්ෂය | ශුද්ධ ලාභය |
|---|---|
| 2017 | 200000 |
| 2018 | 180000 |
| 2019 | 125000 |

මෙම ව්‍යාපාරයේ කාර්ය සාධනය අඩුවෙමින් පවතී ·

✓ **පුරෝකථන හැකියාව**

මූල්‍ය ගිණුම්කරණ තොරතුරු භාවිතා කර ඒවා තුළින් ව්‍යාපාරය **අනාගතය** පිළිබඳව පැවසිය හැකි නම් අදාළ තොරතුරු පුරෝකථතන හැකියාවෙන් යුක්තය·

ඉහත නිදසුනට අනුව පවතින ක්‍රියාකාරී මට්ටමින්ම ව්‍යාපාරය පැවතුණහොත් ඉදිරියේ අලාභ ලබන තත්වයකට පත්වේ·

✓ **ප්‍රමාණාත්මක බව**

කිසියම් තොරතුරු **ඉදිරිපත් කිරීම හෝ නොකිරීම මත** තීරණවල යම් වෙනසක් සිදුවන්නේ නම් අදාළ තොරතුරු ප්‍රමාණාත්මක තොරතුරක් වේ ·

- **විශ්වාසනීය නියෝජනය**

මූල්‍ය වාර්තා මගින් ඉදිරිපත් කරනු ලබන ආර්ථික සිද්ධීන් විශ්වාසනීය නියෝජනයක් නිරූපණය වන පරිදි ඉදිරිපත් කළ යුතුය. උදාහරණ

කල්බදු වල මෙහෙයුම් කල්බද්ද ඉවත් කර ඇත්තේ මෙහෙයුම් යටතේ මූල්‍ය කල්බදු වාරික ඇතුලත් කරන නිසාය.

තොරතුරු විශ්වසනීය ලෙස නිරූපනය කිරීම සඳහා තොරතුරු පහත අනු ලක්ෂණ වලින් යුක්ත විය යුතුය.

- සම්පූර්ණ වීම
- මධ්‍යස්ථ වීම
- වැරදි වලින් තොර වීම

<u>**වැඩි දියුණු කිරීමේ ගති ලක්ෂණ**</u>

අදාල බවින් හා විශ්වසනීය නියෝජනයෙන් යුත් තොරතුරු **තීරණ ගැනීමට සුදුසු වීම** වැඩි දියුණු වීම අනෙකුත් ගුණාත්මක ගති ලක්ෂණ වලින් සිදුවේ.

- සංසන්දනාත්මක බව
- සත්‍යාපනය කළ හැකි බව
- කාලීන බව
- තේරුම් ගත හැකි බව

✓ **සංසන්දනාත්මක බව**

ව්‍යාපාර ඒකකයක තොරතුරු පසුගිය කාලේච්ඡේද සමගත් වෙනත් සමාන ඒකකවල තොරතුරු සමඟත් සංසන්දනය කිරීමේ හැකියාව මින් අදහස් වේ.

✓ **සත්‍යාපන කළ හැකි බව**

ව්‍යාපාරි ඒකකයෙහි ගනුදෙනු හා සිද්ධීන් විශ්වාසනීය ලෙස ඉදිරිපත් කරන තොරතුරු වලින් නියෝජනය කර ඇද්ද යන්න සනාථ කිරීමට ඇති හැකියාවයි.

✓ **කාලීන බව**

තීරණ ගන්නා පාර්ශවයන්ගේ තීරණ වල බලපෑම් කිරීමට සුදුසු වීම ට **කලට වෙලාවට** තොරතුරු සැපයීම මින් අදහස් කෙරේ.

✓ **තේරුම් ගත හැකි බව**

තොරතුරු භාවිතා කරන පාර්ශවයන්ට තොරතුරු වර්ග **පැහැදිලිව හා සංෂිප්තව** දැක්විය යුතු බව මින් අදහස් වේ.

## මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග

- වත්කම්
- වගකීම්
- හිමිකම්
- ආදායම්
- වියදම්

### ▪ වත්කම්

අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ව්‍යාපාර ඒකකය විසින් පාලනය කරන වර්තමාන ආර්ථික සම්පත්කි·

**ආර්ථික සම්පත්** යනු ආර්ථික ප්‍රතිලාභ ඉපදවීමේ හව්‍යතාවයක් ඇති සම්පතකි·

**වත්කමක ලක්ෂණ ඃ**

- ✓ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වීම
- ✓ ව්‍යාපාර ඒකකයක් විසින් පාලනය කිරීම
- ✓ වර්තමාන ආර්ථික සම්පතක් වීම

### • වගකීම්

අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙස ආර්ථික සම්පත් පවරාදීම සම්බන්ධයෙන් ව්‍යාපාර ඒකකයක් සතු වර්තමාන බැඳීමකි·

**වගකීමක ලක්ෂණ**

- ✓ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වීම
- ✓ ආර්ථික සම්පත් පවරා දීමක් සිදු වීම
- ✓ වර්තමාන බැඳීමක් තිබීම

### • හිමිකම්

ව්‍යාපාරය වත්කම් වලින් එහි සියලු වගකීම් අඩු කළ පසු වත්කම්වල ඉතිරිවන ඇල්මයි

### • ආදායම්

වත්කම් වල වැඩි වීමේ හෝ වගකීම අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන හිමිකම සඳහා සහභාගි වන්නන් ගේ දායකත්වයන් ගේ හැර හිමිකමෙහි සිදුවන වැඩිවීමකි·

### • වියදම්

වත්කම් බත්කම් වල අඩු වීමේ හෝ වගකීම් වල වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන හිමිකම සඳහා සහභාගිවන්නන්ට කරන බෙදාහැරීමක් නොවන හිමිකමේ සිදුවන අඩුවීමකි·

## මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග හඳුනා හඳුනාගැනීම්

මූල්‍ය ප්‍රකාශනවල ඉහත මූලිකාංග  මූල්‍ය ප්‍රකාශන වල මුහුණතට ගෙනඒම සඳහා හඳුනා ගන්නා අයුරු මෙහිදී අවධානය යොමු කෙරේ· මූල්‍ය වාර්තා වාර්ථාකරණයේ  සංකල්පනාත්මක රාමුව ට අනුව මූලිකාංග හඳුනාගැනීම සඳහා පහත නිර්ණායක අදාල කරගත යුතුවේ

- ✓ වත්කමක හෝ වගකීමක සහ ඒවායේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන ඕනෑම ආදායම් වියදම් හෝ හිමිකමේ වෙනස් වීම් පිළිබඳ තොරතුරු සැපයීම්·
- ✓ වත්කමක හෝ වගකීමක සහ ඒවායේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන ඕනෑම ආදායම් වියදම් හෝ හිමිකම වෙනස් වීම පිළිබඳ  පිරිවැය හෝ වටිනාකම් විශ්වාසනීය ලෙස මැනීමක් සිදුකිරීම

### මූලිකාංග මැනීම

මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග වල මූල්‍ය වටිනාකම තීරණය කිරීමේ ක්‍රියාවලිය මින් අදහස්වේ·  මෙය ප්‍රධාන ක්‍රම දෙකක් යටතේ විස්තර කෙරේ·

- ✓ ඓතිහාසික පිරිවැය
- ✓ සාධාරණ අගය
- ✓ ප්‍රයෝජ්‍ය අගය සහ ඉෂ්ට කිරීමේ අගය
- ✓ ප්‍රවර්තන පිරිවැය

සංකල්පනාත්මක රාමුව මූල්‍ය ප්‍රකාශන වල මූලිකාංග මැනීමට ඉහත ක්‍රම භාවිතා කළ හැකි වේ·

- ✓ **ඓතිහාසික පිරිවැය**

වත්කම්ක් අත්පත් කරගත් අවස්ථාවේදී හෝ වත්කමක් ඉදිකරන අවස්ථාවේ දී එය අත්පත් කර ගැනීම වෙනුවෙන් හෝ ඉදි ඉදිකිරීම් වෙනුවෙන් ගෙවන ලද හෝ ගෙවීමට එකග වූ මුදල් හෝ මුදල් සමාන දෑ හෝ දෙන ලද  වෙනත් ප්‍රතිෂ්ඨාවක සාධාරණ වටිනාකම පිරිවැය ලෙස හැඳින්වේ

- ✓ **සාධාරණ අගය**

ගණුදෙනුවක් සිදු වන දිනට වෙළඳපලට සහභාගි වන්නන් අතර සිදු වන විධිමත් ගනු ගනුදෙනුවකදී වත්කම් විකිණීමෙන් ලැබෙන මිල හෝ වගකීමක් පැවරීමෙන් ගෙවන මිල වේ·  වෙළෙඳ පලේ විකිණීමෙන් ලැබෙන මිල සාධාරණ මිල වේ·

- ✓ **ප්‍රයෝජ්‍ය අගය  / ඉෂ්ට කිරීමේ අගය**

**වත්කමක්** අනාගතයේ භාවිතා කිරීම නිසා ඇතිවන අනාගත මුදල් ප්‍රවාහ වල වර්තමාන අගය නැතහොත්  අනාගතයේ ලැබෙන ප්‍රතිලාභ වට්ටම් කර අද අගයට   ගෙනඑමේන් ලැබෙන ප්‍රයෝජ්‍ය අගය වෙයි·

**වගකීම්** සම්බන්ධයෙන් අනාගතයේ ගෙවන මුදල් ප්‍රවාහ වල වර්තමාන අගය ඉෂ්ට කිරීමේ අගය ලෙස හඳුන්වයි·

- ✓ **ප්‍රවර්තන පිරිවැය**

පවතින වත්කමට සමාන වත්කමක් වර්තමානයේ ප්‍රතිෂ්ඨාපනය කිරීමට නැතහොත් නැවත ස්ථාපනය කිරීමට දැරීමට සිදුවන පිරිවැය වේ·